**මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------

මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර 2017 නොවැම්බර් 22 දින එළඹි අංක 3585 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V (ඩී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (අ) සුළං බලශක්ති ජනන ධාරිතාව වැඩි කිරීම, (ආ) පද්ධති ප්‍රතික්‍රියාශීලී බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ (ඇ) ව්‍යාපෘති ඉංජිනේරු සැලසුම් සමාලෝචනය සහ අධීක්ෂණය තුළ ණය ගැනුම්කරුගේ ධාරිතාව ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්ති ජනනය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ.ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,923.06 කට සමාන වූ එජඩො මිලියන 256.70 වන අතර ඉන් රු. මිලියන 31,104.84 කට සමාන වූ එජඩො මිලියන 200 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 8,818.22 කට සමාන වූ එජඩො මිලියන 56.70 ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 පෙබරවාරි 22 දින ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 මාර්තු 31දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2 වගුවේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3.2 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව 2022 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුවේ ණය ශේෂය එම දිනයේ LKR අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ශාඛා ගිණුම් කට්ටලයක් ලෙස ව්‍යාපෘති ගිණුම් ක්‍රමවත්ව දැක්වීම ලංකා විදුලිබල මණ්ඩලයේ භාවිතය වේ. මෙය ඉතිහාසය පුරාවටම විගණකවරුන් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිසි ලෙස පිළිගෙන ඇති අතර මෙතෙක් කිසිදු විමසීමක් සිදුකර නොමැත. අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ සාමාන්‍යයෙන් පිළිගත් මූලධර්මවලට අනුකූලව ණය විසර්ජනය සහ අදාළ වත්කම් ඉදිකිරීම වාර්තා කරන අතරතුරය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සියලුම ගනුදෙනු පොදු ලෙජරයේ සටහන් කර ඇත. අදාළ ණය මුදල් අමාත්‍යාංශයේ මහපෙන්වීමට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු විසින් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සහ පියවීම සිදු කරයි. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ පොදු ලෙජරය යටතේ ණය සටහන් කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 23 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 හි 4.3 වගන්තිය | විධිවිධානයට පටහැනිව, ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් 2022 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත එකතුව රු.මිලියන 6.7ක් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවලට අදාළ චක්‍රලේඛ උපදෙස් දැඩිව පිළිපැදිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි V සී (31) වගන්තිය. | වෙනම මුදල් පොතක් පවත්වාගෙන යනු වෙනුවට ව්‍යාපෘතියේ රිසිට්පත් සහ ගෙවීම් පිළිබඳ වාර්තා කිරීම සඳහා ව්‍යාපෘති අංශයේ පොදු මුදල් පොත භාවිත කර තිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | අත්පොතෙහි අවශ්‍යතාවය අනුව වෙනම මුදල් පොතක් පවත්වාගෙන යා යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියට මාරු කරන ලද දේපල, පිරියත සහ උපකරණ වාර්තා කිරීම සඳහා විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය මූල්‍ය ශාඛාවේ - ව්‍යාපෘති අංශයේ ව්‍යාපෘති අනුව නිසි ලෙස පවත්වාගෙන යනු ලැබේ. | ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් සහ අත්‍යවශ්‍ය අමතර කොටස් රු.මිලියන 26,008ක් සඳහා 2022 දෙසැම්බර් 31 වන දිනට නිසි ලෙස පත් කරන ලද සමීක්ෂණ මණ්ඩල කමිටුව විසින් භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සහ අත්‍යවශ්‍ය අමතර කොටස් භෞතික සත්‍යාපනය කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ (මන්නාරම සුළං බලය) විසින් කමිටුවක් පත් කර ඇති අතර එම ලිපිය මේ සමඟ අමුණා ඇත.භෞතික සත්‍යාපනය පිළිබඳ වාර්තාව මේ සමඟ අමුණා ඇත. | සමීක්ෂණ මණ්ඩල කමිටුව විසින් නිසි පරිදි අත්සන් කරන ලද භෞතික සත්‍යාපන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු

| ඉඩම් කට්ටි සංඛ්‍යාව | | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| **අත්පත් කර ගැනීමට අපේක්ෂිත** | **2022 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගැනීම්** | **හිමිකාරිත්වය මාරු කිරීම්** | | |
| අත්පත් කරගත් ඉඩම් - WTG ස්ථාන (38), ප්‍රවේශ මාර්ග (7) සහ නවාතැන් භූමි (1) | අත්පත් කරගන්නා ලදී. (භුක්තිය 38a නියෝගයකි) | උප බිම් 112 න් 55 ක් සඳහා පැවරුම් සහතික නියෝග ලැබී තිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | අනාගත ගැටුම් වළක්වා ගැනීම සඳහා ඉඩම්වල හිමිකාරිත්වය වහාම මාරු කල යුතුය. |